# ව්‍යවස්ථාව

## ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි

වර්ෂ 2016 සැප්තැම්බර් 17 වෙනිදා පැවැත්වූ ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි සංවිධානයේ අල් මජ්ලිස් සභාවෙන් අනුමත කරන ලදී

## පෙරවදන

සියලු ප්‍රශංසා අල්ලාහ්ට හිමිය. ඔහුගේ සලවාතය සහ සලාමය ධර්මදූත මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා වෙතත් අවසාන දිනය දක්වා ඔහුව පිළිපදින යහ ගැත්තන් කෙරෙහිද අත්වේවා.

ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය සංවිධානවල ඉතිහාසයේ මුල් අවධියේම ආරම්භ කළ ව්‍යාපාරයක් වශයෙන් ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාම් සඳහන් කළ හැකිය.

වර්ෂ 1954 දී නිල වශයෙන් ආරම්භ කරන ලදි. එහි පළමු ලිඛිත ව්‍යවස්ථාව 1958 අගෝස්තු 7 වෙනි දින අනුමත කිරීමෙන් අනතුරුව මුද්‍රිත ප්‍රකාශයක් වශයෙන් එළිදක්වන ලදී. එදා සිට 2016 සැප්තැම්බර් මස 17 වෙනි දින සිට ක්‍රියාවට නැංවූ මෙම ව්‍යවස්ථාව දක්වා ව්‍යවස්ථා තුනක් ආදේශ කර ඇත.

තම ඉලක්ක හා ක්‍රියාපටිපාටි, සීමාවන් ව්‍යුහය මූලික රෙගුලාසි වැනි සියල්ල සියළුදෙනාම තේරුම්ගත හැකි ආකාරයෙන් තිබිය යුතුය. එහිදී අවෘතභාවයට ඉඩ නොතැබිය යුතුය යන්න ජමාඅතේ ඉස්ලාම් තරයේ විශ්වාස කල නිසාම තම ව්‍යවස්ථාව පොතක් වශයෙන් මුද්‍රණය කිරීමට කටයුතු කළේය.

ඉස්ලාමයේ ජාත්‍යන්තර ස්වභාවය හා මුස්ලිම් උම්මා වේ ජාත්‍යන්තර ව්‍යාප්තිය යනාදිය සැලකිල්ලට ගන්නා අතරම මෙම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවට ආවේනික සංවිධානයක් වශයෙන් ජමාඅතේ ඉස්ලාම් අර්ථකථනය කරයි.

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමය සමඟ එකතුවී කටයුතු කරන සියලුදෙනාම සමාජයේ හා ජාතියේ යහපතට අතහිත දීමද මෙම ව්‍යවස්ථාවෙන් තහවුරු වේ.

ව්‍යවස්ථාවක් යනු සාධාරණය විවෘතබව, වගකීම යනාදියෙහි සංකේතයක් වන නිසා ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාම් එවැනි සාරධර්ම ආරක්ෂා කිරීමෙහිලා කවදත් දිවිහිමියෙන් කටයුතු කරනු ඇත. ඉන්ෂා අල්ලාහ්.

**රෂීද් හජ්ජුල් අක්බර්**
අමීර් (සභාපති),
ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාම්
2018/09/01

# ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි සංවිධානයේ ව්‍යවස්ථාව

## පරිච්ඡේදය - 1

### නම

1. මෙම සංවිධානයේ නම 'ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි' යන්නයි. මෙය ඉංග්‍රීසියෙන් Sri Lanka Jama'athe Islami යනුවෙන්ද සිංහලෙන් ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි යනුවෙන්ද, දෙමළෙන් "ඉලංගෛයි ජමාඅතේ ඉස්ලාමි" යනුවෙන්ද භාවිතා වේ. එසේම මෙය ඉංග්‍රීසියෙන් Sri Lanka Islamic Association යනුවෙන්ද, සිංහලෙන් ශ්‍රී ලංකා ඉස්ලාමීය සංවිධානය යනුවෙන්ද භාවිතා කල හැකිය. මෙම ව්‍යවස්ථාවේ මින් පසු 'ජමාඅත්' යනුවෙන් සඳහන්වේ.

### ප්‍රතිපත්තිය

2. ජමාඅතයේ ප්‍රතිපත්තිය ඉස්ලාමයේ මූලික සංකල්පය වන "ලා ඉලාහ ඉල්ලල්ලාහු මුහම්මදුර් රසූලුල්ලාහ්" යන්න වේ. එනම් නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත, මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ්ගේ ධර්ම දූතයා වේ යන්නයි.

### පරමාර්ථ

3. ජමාඅතයේ පරමාරථය පහත සඳහන් වේ:

අ) "ආගම ස්ථාපිත කරන්න එහිදී කොටස් වශයෙන් බෙදෙන්න එපා" යන අල් කුර්ආනයේ ආඥාව ක්‍රියාත්මක කිරීමට උත්සාහ කිරීම.

ආ) ජීවිතයේ සියළු කටයුතු ඉස්ලාමයේ ඉගැන්වීම් අනුව ගොඩනැගීම.

ඉ) සෙනෙහස, සහෝදරත්වය, අන්‍යෝන්‍ය සම්බන්ධතාවය, මනුෂ්‍යත්වය වැනි උසස් සාර්ධර්ම ප්‍රගුණ කිරීම.

ඊ) දේශයේ උන්නතියට, සංවර්ධනයට දායකත්වය ලබාදීම.

## ක්‍රියාමාර්ගය

4. ජමාඅතයේ ක්‍රියාමාර්ග පහත සඳහන් වේ.

අ) ඉස්ලාමය හැදෑරීමට උනන්දුකිරීම, සහායවීම.

ආ) ඉස්ලාමය පිළිබඳ නිසි අවබෝධයක් ලබාදීම.

ඉ) ඉස්ලාමය ක්‍රියාත්මක කිරීම සඳහා මුස්ලිම්වරුන්ට මඟපෙන්වීම.

ඊ) ඉස්ලාමය 'ආගම' යන වචනයෙන් කියවෙන පටු අර්ථයෙන් ඔබ්බට ගොස් සියළුම කාලවලට හා සමස්ථ ලෝකජනයාටම සුදුසු ජීවන මාර්ගය වශයෙන් ජීවිතයේ සියළු අංශ ඉස්ලාමය අනුව සකසා ජීවත්වීමට හැකි පුද්ගලයින් හා එවැනි පුද්ගලයින් ඇතුලත් ඉස්ලාමීය පවුල් හා ඉස්ලාමීය සමාජ ක්‍රමයක් ස්ථාපිත කිරීම.

උ) පොදුවේ ශ්‍රී ලංකා පුරවැසියන්ටත් විශේෂයෙන් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ටත් ප්‍රයෝජනවත් විය හැකි සමාජසුභසාධන සැලසුම් ඉදිරියට ගෙනයාම.

ඌ) ජනවර්ග අතර අන්‍යෝන්‍ය අවබෝධය හා හොඳහිත වර්ධනය කිරීමට සහායවන ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම.

එ) මිනිස් සුභසාදනය, මිනිස් අයිතිවාසිකම් යනාදිය තහවුරු කිරීමෙහිලා දායක වීම.

ඒ) ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීමේ මෙහෙවරට දායකවීම.

ඓ) දේශයේ සංවර්ධනය හා සාමය සම්බන්ධ ව්‍යාපෘතිවලදී දායකත්වය දැක්වීම.

ඔ) 3 වෙනි වගන්තියේ සඳහන් පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා හෝ එයට සවිබලදෙන සුදුසු වෙනත් ක්‍රියාමාර්ග ගැනීම.

## මඟපෙන්වීමේ මූලිකාංග

5. ජමාඅතයේ අකීදාව (ප්‍රතිපත්තිය) අමල්, සහ ක්‍රියාව අල් කුර්ආනය සහ සුන්නාහ්ව පදනම් කරගෙන හා ඒවාට සුන්නත් වල් ජමාආතය සපයන විග්‍රහය පදනම් කරගෙන සකස් කැරේ.

6. ජමාඅතයේ සියලු ක්‍රියාකාරකම් ඉස්ලාමයේ මධ්‍යම ප්‍රතිපදා සංකල්පය ආනුව සිදු කෙරේ.

7. ඉස්ලාමය අවධාරණය කරන මානව සාරධර්ම ජමාඅතය විසින් සම්පූර්ණයෙන් ආරක්ෂා කැරේ.

8. ජමාඅතේ ඉස්ලාම් යන නමින් හෝ වෙනත් නමකින් හෝ දේශීය හෝ ජාත්‍යන්තරව ක්‍රියාත්මක වන කිසිම සංවිධානයක් සමඟ ජමාඅතය කිසිදු පාලනමය සම්බන්ධතාවක් නොපෙන්වයි. ජමාඅතය නිදහස්ව නිවහල්ව ක්‍රියාත්මක වන සංවිධානයකි.

9. ජමාඅතය තම ක්‍රියාවලදී නීත්‍යානුකූල හා සාමකාමී මාර්ග පිළිපදී.

10. ජමාඅතය පක්ෂ දේශපාලනයෙන් තොරව කටයුතු කරයි.

# පරිච්ඡේදය - 02
# සාමාජිකත්වය

## සාමාජිකත්වය

11. ජමාඅතයේ සාමාජිකත්වය දෙවැදෑරුම්වේ.

අ) මුන්තසිබ් සාමාජිකත්වය. මෙම සාමාජිකත්වය ලබාග න්නා අයෙකු 'මුන්තසිබ්' යනුවෙන් හැඳින්වේ.

ආ) සහාය සාමාජිකත්වය. මෙම සාමාජිකත්වය ලබන්නා සහාය සාමාජිකයා' යනුවෙන් හැඳින්වේ.

12. අයෙකුට සහාය සාමාජිකත්වය දීමේදී එවකට සම්පූර්ණ සහාය සාමාජිකයන්ගේ සංඛ්‍යාව මුන්තසිබ් සාමාජිකයින්ගේ සංඛ්‍යාවෙන් 10% ඉක්මවා නොමැති බව තහවුරු කරගත යුතුය.

# සාමාජිකත්ව සුදුසුකම්

## මුන්තසිබ් සාමාජිකත්වය ඃ

13. මුනිතසිබ් සාමාජිකයෙකු සතුව තිබිය යුතු සුදුසුකම් ඃ

අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

ආ) වයස අවු ඃ 23 ඉක්මවා තිබීම. මජ්ලිස් ෂූරාවට මෙම වයස් සීමාව වෙනසක් කළ හැකිය.

ඉ) ඉස්ලාමය ඉගෙනීමේදීත් එය ක්‍රියාවට නැංවීමේදීත් උනන්දුවෙන් සිටින අතර සෙස්සන්ද එසේ ඉගෙනගෙන ක්‍රියාත්මක කිරීමට දිරිගැන්වීමෙහිලා කැමැත්තෙන් හා ලැදියාවෙන් පසුවීම

ඊ) ඉස්ලාමයෙන් පනවා ඇති මූලික වගකීම් ඉටුකරන අතර සුන්නාහ් වලද සැලකිලිමත් වීම.

උ) මෙම සාමාජිකත්වය ලබාගැනීම සඳහා ජමාඅතය නියම කරන පුහුණු පාඨමාලා සම්පූර්ණ කර තිබීම.

ඌ) තම ජීවිතයේ හරාම්, හලාල් පිළිපැදීම.

එ) ජමාඅතයේ ප්‍රතිපත්තිය, පරමාර්ථය, සංයුතිය ක්‍රියාමර්ග සහ සීමාවන් අගය කිරීම, අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

ඒ) ව්‍යවසථාවේ විධි විධානවලට ගරු කර, ඒවා පිළිගෙන ක්‍රියාත්මක කර ආරක්ෂා කිරීම.

## සහාය සාමාජිකත්වය

14 සහාය සාමාජිකයෙකු සතුව තිබිය යුතු සුදුසුකම්.

අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුවීම.

ආ) වයස 35 ඉක්මවා තිබීම.

ඉ) ඉස්ලාමය ඉගෙනීමේදීත්, එය ක්‍රියාවට නැංවීමේදීත් උනන්දුවෙන් සිටීම.

ඊ) ඉස්ලාමය පනවා ඇති මූලික වගකීම් ඉටුකිරීම.

උ) තම ජීවිතයේ හලාල්, හරාම් පිළිපැදීම.

ඌ) සහාය සාමාජිකත්වයට අවශ්‍ය ජමාඅතයේ පුහුණු සැසි සම්පූර්ණ කර තිබීම.

එ) ජමාඅතයේ ප්‍රතිපත්තිය, පරමාර්ථය, ක්‍රියා පිළිවෙල හා සීමාවන් අගයකිරීම, අනුමත කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

ඒ) ව්‍යස්ථාවේ විධි විධාන අගය කිරීම, අනුමත කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

## සාමාජිකයින්ගේ අයිතිවාසිකම්

### මුන්තසිබ් සාමාජිකයින්ගේ අයිතිවාසිකම්

15. මුන්තසිබ් සාමාජිකයින්ගේ අයිතිවාසිකම් පහත සඳහන් වේ.

අ) අල් මජ්ලිසුල් ආම්, ප්‍රාන්ථ සාමාජික සභාව, ශාඛා සාමාජික සභාව යනාදියෙහි සාමාජිකත්ය ලැබීම.

ආ) ව්‍යවස්ථාවේ විධි විධානවලට අනුකූල ජාතික ප්‍රාන්ත, උප ප්‍රාන්ථ හා ශාඛා මට්ටමේ ඡන්දය භාවිතා කිරීම.

ඉ) ව්‍යවස්ථාවේ විධි විධානවලට අනුකූලව ජාතික, ප්‍රාන්ථ, උප ප්‍රාන්ථ හා ශාඛා මට්ටමේ තනතුරුදැරීම.

ඊ) ව්‍යවසථාවේ විධි විධානවලට අනුකූලව අල් මජ්ලිස් මධ්‍යම ෂූරාව, ප්‍රාන්ත ෂූරාව සහ ශාඛා ෂූරාවලට තෝරා ගනු ලැබීම.

### සහාය සාමාජිකත්වයේ අයිතිවාසිකම්

16. සහාය සාමාජිකයෙකුගේ අයිතීන් පහත සඳහන් වේ.

අ) අල් මජිලිසුල් ආම්හි සාමාජිකත්වය ලැබීම.

ආ) අමීර් තෝරාගැනීමේදී ඡන්දය දීම.

ඉ) අමීර් විසින් හෝ මජ්ලිස් ෂූරාව විසින් දෙනු ලබන වගකීම් හෝ තනතුරු දැරීම.

ඊ) අල් මජ්ලිසයට හා මජ්ලිසුෂ් ෂූරාවට පත්කල සාමාජිකයෙකු වශයෙන් තෝරාපත්වීම.

## සාමාජිකත්වය ලැබීම

17. කෙනෙකුට ජමාඅත් සාමාජිකත්වය පිරිනැමීමේ බලය ඇත්තේ මජ්ලිස් ෂූරාවටයි.

18. සාමාජිකත්වය ලබන අයෙකු ඇමුණුම 1 හි ඇති පරිදි අවශ්‍ය වෙනස්කම් සමගින් මධ්‍යම ෂූරාවේ හෝ අල් මජ්ලිස්හි හෝ අල් මජ්ලිසුල් ආම් හි හෝ අමීර් ඉදිරියේ හෝ වැඩබලන අමීර් ඉදිරියේ හෝ මහ ලේකම් ඉදිරියේ (බෛඅත්) දිවුරුම් දිය යුතුයි.

## සාමාජිකත්වය අහිමිවීම

19. පහත අවස්ථාවන්හි ජමාඅත් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහිමිවේ.

අ) ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අහෝසිවීම.

ආ) ඉල්ලා අස්වීම බාරදී එය මජ්ලිසුල් ෂූරාව විසින් අනුමත කරනු ලැබීම.

ඉ) අයෙකු ජමාඅත් කටයුතුවල වසරකට වැඩි කාලයක් සම්බනධයෙන් තොර සිටීම. තමා කළ බෛඅතයයට වරුද්ධව වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ කටයුතු කිරීම වැනි ඒවායින් කිසියම් කාරණයක් හේතුකොටගෙන ඔහුව සාමාජිකත්වයෙන් නෙරපීමට මධ්‍යම මජ්ලිස් ෂූරාව තීරණය කිරීම.

## සාමාජිකත්වය අත්හිටුවීම

20) ඕනෑම සාමාජිකයෙකු 19 (ඉ) වගන්තියේ සඳහන් හේතුන් නිසා සාමාජිකත්වයෙන් අතිහිටුවීමේ බලය ජමාඅත් අමීර් (සභාපති) ට ඇත. එම අත්හිටුවීම මාස තුනකට වඩා දීර්ඝ වන්නේ නම් මධ්‍යම මජ්ලිස් ෂූරාවේ අනුමැතිය ලබාගත යුතුය.

## සාමාජික අයිතීන් අත්හිටුවීම

21) තම පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා ජමාඅත් සාමාජිකයෙකු විදෙස් රටකට ගොස් මාස තුනකට වැඩි කාලයක් රැඳී සිටින්නේ නම් එම කාලවකවානුව තුළ ඔහුට 15,16 වන වගන්තිවල අඩංගු අයිතිවාසිකම් අහිමිවේ. ඔහු මව්රටට පැමිණි වහාම ඒ බව ලේකම්ට දැනුම් දීමෙන් සාමාජික අයිතිවාසිකම් නැවත ලබාගත හැකිවේ.

### පරිච්ඡේදය - 3
### පරිපාලන ව්‍යූහය

22. පරිපාලන අවශ්‍යතා සඳහා ජමාඅතයේ පරිපාලන ව්‍යූහය පහත ආකාරයට ගොඩනැගී ඇත.

අ) අමීර් (සභාපති)

ආ) නායිබ් අමීර්වරුන් (නියෝජ සභාපතිවරුන්)

ඉ) මහලේකම්

ඊ) මධ්‍යම මජ්ලිස් ෂූරාව

උ) විධායක ෂූරාව

ඌ) ලේකම් කාර්යාලීය ෂූරාව

එ) අල් මජ්ලිස් (නියෝජිත සභාව)

ඒ) අල් මජ්ලිසුල් ආම් (සාමාජික සභාව)

ඓ) මධ්‍යම පරිපාලන තනතුරු, කාරක සභාවන් හා මණ්ඩල

## අමීර්

23. ජමාඅතයේ සභාපති 'අමීර්' යනුවෙන් හඳුන්වනු ලබයි.

## අමීර්ගේ වගකීම් හා බලතල

24. ජමාඅතයේ ව්‍යවස්ථාව හා රීතිවලට අනුව ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස්කිරීම, තීරණ ගැනීම, ඒවා ක්‍රියාවට නැංවීම

යනාදියට නායකත්වය දීම.

25. දේශීය වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් ජමාඅතය නියෝජනය කිරීම, සමාජ නායකත්ව සමඟ සම්බන්ධතා ගොඩනැගීම හා ඒවා ආරක්ෂා කිරීම.

26. මධ්‍යම මජ්ලිස් ෂූරා, විධායක ෂූරාව අදියෙහි නායකත්වය දැරීම.

27. පොදුවේ මජ්ලිස් ෂූරාව, විධායක ෂූරාව, සාමාජික සභාව (මජ්ලිසුල් අම්) අදී රැස්වීම් වල මුලසුන දැරීම.

28. දෛනික කටයුතුවලදී ජමාඅතයේ ව්‍යවස්ථාව හා රීතිවලට අනුව තීරණ ගැනීම.

29. වහාම තීරණ ගත යුතු වැදගත් ප්‍රශ්නවලදී මධ්‍යම මජ්ලිස් ෂූරා සාමාජිකයින් සමඟ සාකච්ඡා කර තීරණ ගැනීම. ෂූරාවේ ඊළඟ රැස්වීමේදී එම තීරණ සඳහා වූ අනුමැතිය ලබාගැනීම.

30. පරිපාලනය කාර්යක්ෂමව පවත්වාගෙන යෑම සඳහා නායිබ් අමීර්වරුන්ගේ කෙනෙක්ද, මහලේකම්ද, මජ්ලිස් ෂූරා සාමාජිකයින්ගෙන් පත්කිරීම. අනෙකුත් ලේකම්වරුන්, කාරකසභා හා අවශ්‍ය නිලධාරීන්ද මධ්‍යම ෂූරාවේ උපදෙස් අනුව පත්කිරීම.

31. ජමාඅතයේ තනතුරු ලාභීන්, කාරකසභාවන්, ප්‍රාන්ත, උප ප්‍රාන්ත ශාඛා අත්හිටුවීම, ඊළඟ මජ්ලිස් ෂූරාවේදී ඒ සඳහා අනුමැතිය ගත යුතුය.

## අමීර් පදවිය සඳහාවූ සුදුසුකම්

32. මුත්තසිබ් සාමාජිකයෙකු වීම.

33. අමීර්වරණය පැවැත්වෙන වාරයට පෙර පැවති අල් මජලිස් පහෙන් අවමය තුනක හෝ සාමාජිකත්වය ලබා තිබීම.

## අමීර් පදවියේ කාලසීමාව

34. අමීර් පදවියේ එක් වාරයක් යනු වසර හතරකින් යුක්තයි.

35. නොකඩවා වාර දෙකක් මෙම ව්‍යවස්ථාවේ හෝ මීට පෙර පැවතී

ව්‍යවස්ථාවල විධි විධාන අනුව හෝ නොකඩවා වාර දෙකක් අමීර් පදවිය දැරූ අයෙක් ඊළඟ වාරයේ අමීර් පදවි දැරීමට සුදුසුකම් නොලබයි. එහෙත් තුන්වැනි වරටත් ඔහු අමීර් පදවිය දැරීමට සුදුසු බව මධ්‍යම මජ්ලිසුෂ් ෂූරා තීරණය කරයි නම් ඔහු අමීර් වරණය සඳහා මජ්ලිසුෂ් ෂූරාව අල් මජ්ලිසයට නිර්දේශ කල හැකිය. එය අල් මජ්ලිසය විසින් පිළිගනු ලැබුවහොත් ඔහු තෙවැනි වාරයටත් අමීර් වරණයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි. මජිලිසුෂ් ෂූරා මෙසේ කෙනෙකු නිර්දේශ කළ හැක්කේ එක් වතාවක් පමණි.

## අමීර් වරණය

36. අමීර් අල් මජ්ලිසුල් ආම් රැස්වීමේදී අල් මජ්ලිසුල් ආම් සාමාජිකයින්ගේ රහස් ඡන්දයෙන් තෝරාගනු ලැබේ.

37. අල් මජ්ලිස් අවශ්‍යයි සිතන්නේ නම් අමීර් පදවි දැරීමට සුදුසු අයගෙන් උපරිම තිදෙනෙකු රහස් ඡන්දයෙන් තෝරා ඔවුන්ගේ නම් අල් මජ්ලිසුල් ආම් වෙත යෝජනා කළ හැකිය. එසේ යෝජනා කරන නම් අමීර්වරණයට පෙර මහලේකම් විසින් සභාවේ දැනුම් දෙනු ලැබේ. කෙසේ වෙතත් අල් මජ්ලිසුල් ආම් සාමාජිකයින්ට ඉන් පිටස්තර අයෙකුටද ඡන්දය දීමේ අයිතිය ඇත.

38. මධ්‍යම මජ්ලිස් ෂූරාව අවශ්‍යයයි සිතන්නේ නම් 37 වෙනි වගන්තියේ සඳහන් අරමුණු වෙනුවෙන් උපරිමය තුන් දෙනෙකුගේ නම් අල් මජ්ලිසයට යෝජනා කළ හැකිය. කෙසේ වෙතත් යෝජනා කල අයට හෝ ඉන් පිටස්තර අයට හෝ ඡන්දය දීමේ අයිතිය අල් මජ්ලිස් සාමාජිකයින්ට ඇත.

39. අමීර්වරණය සිදුකෙරෙන අල් මජ්ලිසුල් ආම් රැස්වීමේ ආරාධනා පත්‍රයෙහි අමීර්වරණය පැවැත්වෙන බව සඳහන් කළ යුතුය.

40. තෝරා පත්වූ අමීර්වරයෙකු එම පදවිය දැරීම ප්‍රතික්ෂේ කරන්නේ නම් නැවත ඡන්දය විමසිය යුතුය.

## අමීර්වරයාගේ බෛඅතය (දිවුරුම්දීම)

41. අමීර් පදවියට තෝරාපත්වූ අයෙක් ඇමුණුම 2 හි සඳහන් ආකාරයට අල් මජ්ලිස් ආම් සභාවේ බෛඅත් කළ යුතුය. අමීර්වරයාගේ බෛඅතය අල් මජ්ලිසුල් ආම් සභාවේදී

සිදුකිරීමට අපොහොසත් වූ විට එවකට මජ්ලිස් ෂූරාවේ හෝ අල් මජ්ලිසයේ බෙඅත් කළ හැකිය.

42. අමීර්වරයාගේ බෙඅතයෙන් පසු ඇමුණුම 3 හි පරිදි අල් මජ්ලිසුල් ආම් සාමාජිකයින් අමීර්වරයාට බෙඅත් කළ යුතුය. තෝරාපත්වූ අමීර්වරයාට සාමාජිකයින් කරන බෙඅතය අල් මජ්ලිසුල් ආම් සභාවේදී සිදුවූවිට එය ජමාඅත් සාමාජිකයින් සියල්ලන්ගේ බෙඅත් බවට සලකනු ලැබේ.

43. අභිනවයෙන් තෝරාපත්වන අමීර්වරයාට සාමාජිකයින් කරන බෙඅතය අල් මජ්ලිසුල් ආම්හි සිදුනොවුයේ නම් ඊළඟ මාස හයක කාලයක් තුළ අමීර්වරයාගේ ඉදිරියේ හෝ ඔහුගේ නියෝජිතයෙකු ඉදිරියේ හෝ සාමාජිකයින් බෙඅත් කළ හැකිය සාමාජික සංඛ්‍යාවෙන් 51% බෙඅත් කළ විට එය සියලු සාමාජිකයින් බෙඅත් කළ බවට පිළිගැනේ.

## අමීර් පදවිය පුරප්පාඩුවීම

44. පහත අවස්ථාවලදී අමීර් පදවිය පුරප්පාඩු වේ.

අ) අමීර්වරයාගේ ඉල්ලා අස්වීම ෂූරාව විසින් පිළිගැනීම

ආ) මරණය සිදුවීම.

45. අමීර් පදවිය හොබවන අයෙකු,

අ. ඉස්ලාමයට පටහැනි විශ්වාසයන් හෝ ක්‍රියාවෙන් පසුවීම

ආ. ජමාඅතයේ පරමාර්ථයට විරුද්ධ පරමාර්තවලින් සමන්විත වීම.

ඉ. වගකීම නිසියාකාරයෙන් ඉටු නොකිරීම.

ඊ. තම බලය අයුතු ලෙස භාවිතා කිරීම

උ. ජමාඅතයේ ව්‍යස්ථාවට හිතාමතා එරෙහිවීම

ඌ. තම පෞද්ගලික හේතුවක් වෙනුවෙන් නොකඩවා මාස තුනකට අධික කාලක් හෝ තම එක් පදවි වාරයේ මාස හයකට වැඩි කාලයක් අමීර් පදවියට අයත් වගකීම්

ඉටුකිරීමට අපොහොසත්වීම යන කරුණු වලින් එකක් හෝ කිහියපක් හේතුකොටගෙන ජමාඅතයේ අමීර් පදවි දැරීමට නුසුදුසුයි යන යෝජනවා මධ්‍යම මජ්ලිස් ෂූරාවට සහභාගිවූ අයගෙන් 2/3 සම්මුතියෙන් අමීර්වරයාගේ පදවි අත්හිටුවීමට ෂූරාවට බලය ඇත. එසේ අමීර්වරයාගේ පදවිය අත්හිටුවනු ලැබූවිටක ඊළඟ මාසයක් ඇතුලත මහලේකම් විසින් අල් මජ්ලිස් සභාව රැස්කර ඉහත යෝචනාව ඉදිරිපත් කල යුතුය. එම යෝජනාව අල් මජ්ලිසයේ 2/3 බහුතරයෙන් අනුමතවුවහොත් අමීර්වරයාගේ පදවිය අහිමිවේ.

46. 45 වෙනි වගන්තියේ සඳහන් ආකාරයේ යෝජනාවක් අල් මජ්ලිසය විසින් ප්‍රතික්ෂේප කළ විටක මධ්‍යම මජ්ලිස් ෂූරා ඉල්ලා අස්විය යුතුය. අමීර්වරාය තවදුරටත් තනතුරේ රැඳී සිටී. එවැනි අවස්ථාවක එම සභා රැස්වීමේදීම නව මජ්ලිස් ෂූරාවක් තෝරාපත් විය යුතුය. එසේ තෝරාගනු ලබන මධ්‍යම මජ්ලිස් ෂූරාව කලින් සිටි ෂූරාවේ ඉතිරි කාලය සඳහා බල පැවැත්වේ

47. අමීර්වරයා නිවාඩු ලබා ගන්නා විට මහලේකම් හෝ නායිබ් අමීර්වරුන්ගෙන් කෙනෙකු හෝ වැඩ බලන අමීර් වශයෙන් පත්කල හැකිය.

48. 45 සහ 46 වගන්තිවල විධි විධාන අනුව අමීර් තනතුර පුරප්පාඩුවූ අවස්ථාවකදී මහලේකම් තාවකාලික අමීර් වශයෙන් කටයුතු කරයි. ඔහු සතියක් ඇතුලත මජ්ලිස් ෂූරාව රැස්කළ යුතුය. එම රැස්වීමේදී වැඩබලන අමීර්වරයෙකු තෝරාපත් කෙරේ. එම රැස්වීමේ කැඳවීම් ලිපියේ වැඩබලන අමීර් තෝරාගැනීම පිළිබඳ සඳහන් කළ යුතුය. මෙසේ තෝරගන්නා අමීර්වරයා නව අමීර්වරයෙකු තෝරාපත්වන තෙක් එම තනතුරේ රැඳී සිටී. මෙසේ තෝරාපත්වන වැඩබලන අමීර්වරයා නව අමීර් තෝරාපත්වන තෙක් අමීර් සතු සියලු බල තල සමඟ කටයුතු කරයි. නව අමීර්වරයා තෝරාගන්නා අල් මජ්ලිසුල් ආම් සභාව වසරක කාලයක් තුළ රැස්කල යුතුය. එහිදී තෝරාපත්වන අමීර් පුරප්පාඩුවූ අමීර් පදවියේ ඉතිරි කාලය සඳහා අමීර් තනතුර දරයි. මෙම පදවි කාලය 35 වගන්තියේ විධි විධාන සඳහා අදාල නොවේ.

## නායිබ් අමීර් (නියෝජ සභාපති)

49. ජමාඅතයේ නායිබ් අමීර්වරුන් තිදෙනෙකු සිටිති.

## නායිබ් අමීර් පදවිය සඳහාවූ සුදුසුකම්

50. නායිබ් අමීර් පදවියේ සුදුසුකම්

අ. මුන්තසිබ් සාමාජිකයෙකු වශයෙන් හා අල් මජ්ලිස් සාමාජිකයෙකු වශයෙන් සිටීම.

ආ. තෝරාගැනීමේදී හෝ පතකිරීමේදී හෝ වයස 55 ට අඩුවීම. අමීර් තනතුර දැරුවෙකුට මෙම වයස් සීමාව අදාල නොවේ.

ඉ. අවම වශයෙන් දෙවතාවක් හෝ අල් මජ්ලිස් සභාවේ සාමාජිකයෙකු වී තිබීම.

## නායිබ් අමීර්වරුන්ගේ වගකීම් සහ බලතල

51. නායිබ් අමීර්වරුන්ගේ වගකීම් සහ බලතල.

අ. ව්‍යවස්ථාවේ විධි විධානයන්ට අනුකූලව අමීර්වරයා තම බලතලවලින් හා වගකීම්වලින් නායිබ් අමීර්වරයා වෙත පවරන බලතල හා වගකීම්.

ආ 47 වගන්තියට අනුව වැඩ බලන අමීර් තනතුරට පත්කරනු ලැබීම

ඉ. මධ්‍යම මජ්ලිස් ෂූරාවේ තීරණයට අනුව අල් මජ්ලිසයේ රැ ස්වීම් වලට මුලසුන දැරීම.

## නායිබ් අමීර් වරණය සහ පත්කිරීම

52. නායිබ් අමීර්වරුන්ගෙන් දෙදෙනෙක් අල් මජ්ලිස් රැස්වීමේදී රහස් ඡන්දයෙන් තෝරාගනු ලබති. එක් අයෙකු අමීර්වරයා විසින් පත්කරනු ලැබේ.

## නායිබ් අමීර්වරුන්ගේ බෙඅත් (දිවුරුම්දීම)

53. නායිබ් අමීර්වරුන් ඇමුණුම් 5 හි සඳහන් ආකාරයට අවශ්‍ය වෙනස්කම් සමගින් බෛඅත් කළ යුතුය. මෙය මජ්ලිසුල් ආම්හි

හෝ අල් මජ්ලිස්හි හෝ මධ්‍යම මජ්ලිස් ෂූරා රැස්වීමකදී හෝ සිදුවෙයි.

## නායිබ් අමීර් තනතුර පුරප්පාඩුවීම

54. නායිබ් අමීර් තනතුර පහත සඳහන් අවස්ථාවන්හි පුරප්පාඩුවේ.

අ) ඔහුගේ ඉල්ලා අස්වීමේ ඉල්ලීම මධ්‍යම මජ්ලිෂ් ෂූරාව විසින් පිළිගනු ලැබීම.

ආ) මරණය සිදුවීම

ඉ) අමීර්වරයා විසින් පත්කරන නායිබ් අමීර්ව මධ්‍යම මජ්ලිස් ෂූරාවේ උපදෙස් අනුව අමීර්වරයා විසින් නෙරපනු ලැබීම.

ඊ) අල් මජ්ලිසයෙන් තෝරාපත්කරන ලද නායිබ් අමීර්වරයෙකු නෙරපීමේ ෂූරා යෝජනාව අල් මජ්ලිසය විසින් ස්ථිර කිරීම.

55. අල් මජ්ලිස් විසින් තෝරාපත් කරගන්නා නායිබ් අමීර්ව 45 වගන්තියේ සඳහන් හේතුවක් සම්බන්ධයෙන් අත්හිටුවීමේ බලය අමීර්වරයාට ඇත. මෙම අත්හිටුවීමේ කාලය මාස තුනක් ඉක්මවන්නේ නම් අල් මජ්ලිසයේ අනුමැතිය ලබාගත යුතුය.

56. පුරප්පාඩු වන නායිබ් අමීර් තනතුර ඡන්දයෙන් පත්වූ එකක්නම් අල් මජ්ලිසයේ නැවතත් ඡන්ද විමසා එම පුරප්පාඩුව පිරවිය යුතුය. අමීර්වරයා පත්කළ නායිබ් අමීර්වරයාගේ පුරප්පාඩුව අමීර් විසින් අනුප්‍රාප්ත කැරේ.

## මහලේකම්

57. ජමාඅතය මහලේකම් වරයෙකුගෙන් යුක්තයි. ඔහු මධ්‍ය මජ්ලිස් ෂූරාවේ උපදෙස් මත සාමාජිකයින්ගෙන් අමීර්වරයා විසින් පත්කරනු ලැබේ.

## මහලේකම්ගේ බලතල හා වගකීම්

58. මහලේකම්ගේ බලතල හා වගකීම් පහත සඳහන්වේ.

අ) අමීර්වරයාගේ උපදෙස් අනුව මධ්‍යම ෂූරාව විධායක පරරිපාලන ෂූරාව අල් මජ්ලිස්, අල් මජ්ලිසුල් ආම් ආදී

සහා රැස්කිරීම.

ආ) ජමාඅතයේ සියලු ලියකියවිලි දේපළ හා නිල ලාංඡන වලත් රැකවලා වශයෙන් කටයුතු කිරීම.

ඉ) ජමාඅතයේ නිල ලියකියවිලි හා සන්නිවේදනවලදී ජමාඅතයේ නිල ලාංඡනය යෙදීම භාරව සිටීම.

ඊ) ජමාඅත් පරිපාලන ව්‍යූහයේ සියළු සංරචක අතර සම්බන්ධීකරණය කිරීම.

උ) ලේකම් කාර්යාල ෂූරාවට මුලසුන දැරීම.

ඌ) අමීර් වරණය සඳහාවූ අල් මජ්ලිසයේ යෝජනා අල් මජ්ලිස් ආම් සභාවේ දැනුම්දීම.

## මධ්‍යම මජ්ලිසුෂ් ෂූරාව (මධ්‍යම උපදේශක සභාව)

59. අමීර් සමඟ එකතුවී ජමාඅතයේ ව්‍යස්ථාවට අනුකූලව ප්‍රත්පත්ති සැකසීම, තීරණ ගැනීම, සැලසුම් කිරීම, ඒවා ක්‍රියාවට නැංවීම යනාදියට වගකියන උසස් සභාව ලෙස මධ්‍යම මජ්ලිසුෂ් ෂූරාව කටයුතු කරයි.

60. ෂූරාවේ නායකත්වය හොබවන්නේ අමීර්වරයාය.

61. මෙය අමීර්, නායිබ් අමීර්වරුන් තිදෙනෙකු ඇතුළුව 29 දෙනෙක්ගෙන් සමන්විතයි.

62. මධ්‍යම මජ්ලිස් ෂූරාවේ අමීර්, නායිබ් අමීර්වරුන් තිදෙනෙකුට අමතරව ඇති 25 දෙනාගෙන්

අ) සාමාජිකයන් දහසය (16) දෙනෙකු අල් මජ්ලිසයේ සාමාජිකත්වය දරණ මුන්තසිබ් සාමාජිකයින් විසින් අල් මජ්ලිසයේ සාමාජිකත්වය දරණ මුන්තසිබ් සහ සහාය සාමාජිකයින් ලවා රහස් ඡන්දයෙන් තොරාගනු ලබයි.

ආ) සාමාජිකයින් තිදෙනෙක් කාන්තා ජාතික කණ්ඩායම් සාමාජිකාවන් තුළින් එම සාමාජිකයිනි විසින් රහස් ඡන්දයෙන් තෝරාගනු ලැබේ.

ඉ) සිව්දෙනෙක් (4) අල් මජ්ලිස් සාමජිකයින් තුලින් හා දෙදෙනෙකු කාන්තා ජාතික කණ්ඩායම තුළින් අමීර්වරයා විසින් නම්කරනු ලැබේ.

63. කිසියම් අයෙකු තෝරාගැනීම මගින් නොකඩවා වාර තුනක්

පමණකක් මජ්ලිස් ෂූරාවේ සාමාජිකත්වය ලැබිය හැකිය. මෙය ක්‍රියාත්මක කිරීම වස් සුදුසුකම් අහිමිවෙන අයගේ නම් මධයම මජ්ලිසුෂ් ෂූරා අපේක්ෂක නාම ලේඛනයෙන් ඉවත් කෙරේ. එහෙත් වර්ෂ 1338 මජ්ලිසුෂ් ෂූරා ඡන්ද විමසීමේදී මෙම විධි විධාන අනුව සුදුසුකම් අහිමිවන අයගෙන් 50% පමණක් ඉවත් කෙරේ. සුදුසුකම් අහිමිවන්නන්ගේ ලැයිස්තුව මජ්ලිසුෂ් ෂූරාව විසින් සාකච්ඡා මාර්ගයෙන් තීරණය කෙරේ.

64. මධ්‍යම මජ්ලිස් ෂූරාවේ සාමාජිකයින් ඇමුණුම 4 හි ඇති පරිදි (බෛඅත්) දිවුරුම්දීම කළ යුතුය.

65. මජ්ලිසුෂ් ෂූරා සාමාජිකයෙකු මරණයට පත්වීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ මුන්තසිබ් සාමාජිකත්වය අහිමිවීමෙන් හෝ 70 වගන්තියේ සඳහන් ආකාරයට පදවියෙන් ඉවත් කිරීම වැනි හේතූන් නිසා හෝ ඔහු දැරූ තනතුර පුරප්පාඩුවේ.

66. මජ්ලිසුෂ් ෂූරාවේ ඇතිවෙන පළමු පුරප්පාඩු තුන අමීර්වරයා මජ්ලිසුෂ් ෂූරාවේ උපදෙස් සහිතව සම්පූර්ණ කරයි.

67. එක් වරකදී ඇතිවෙන පුරප්පාඩු සංඛ්‍යාව තුන ඉක්මවන කල එවැනි පුරප්පාඩු ඡන්දයෙන් තෝරාගත් අයගේ නම් වරණ ලැයිස්තුවේ ඊළඟ පුද්ගලයින්ගෙන් ලවා සම්පූර්ණ කෙරේ. අමීර් පත්කල අය සම්බන්ධයෙන් ඇතිවෙන පුරප්පාඩුවක් නම් අමීර්ගේ පත්කිරීම මගින් සම්පූර්ණ කෙරේ.

68. කිසියම් අවස්ථාවක ඇතිවෙන පුරප්පාඩු සංඛ්‍යාව සමස්ථ ෂූරා සාමාජිකයින්ගෙන් 40% වැඩි නම් අල් මජ්ලිස් සභාව රැස්කර රහස් ඡන්දයෙන් එම පුරප්පාඩුවලට පුද්ගලයන් තෝරාගැනේ.

69. මධ්‍යම මජ්ලිස් ෂූරාව මාස තුනකට වරක් වත් රැස්කල යුතුය.

70. මධ්‍යම ෂූරා සාමාජිකයෙකු සම්බන්ධයෙන් මධ්‍යම ෂූරාවෙන් පත්කල පරීක්ෂණ කමිටුවේ නිර්දේශය අනුව ෂූරා සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට නුසුදුසු බව මජ්ලිස් ෂූරා තීරණය කලවිටක ඔහුව මජ්ලිස් ෂූරා සාමාජිකතවයෙන් ඉවත් කිරීමට හෝ සාමාජිකත්වය අත්හිටුවීමට හෝ අමීර්ට බලය ඇත.

71. අමීර්වරයාගේ කිසියම් තීරණයකට මධයම මජ්ලිස් ෂූරාව විරුද්ධවන අවස්ථාවක මජ්ලිස් ෂූරාවේ බහුතර මතය අමීර් පිළිගත නොහැකි බව අමීර්වරයා සිතන්නේ නම් අවසන්

නිගමනය සඳහා අල් මජ්ලිසයට බාරකල හැකිය. අල් මජ්ලිසයේ තීරණය අවසන් තීරණය වේ.

## විධායක ෂූරාව

72. ජමාඅතය විධායක ෂූරාවකින් සමන්විතවේ. එහි නායකත්වය අමීර් සතුය. එය අමීර්, මහලේකම්, මුදල් ලේකම්, නායිබ් අමීර්වරුන් සහ මධ්‍යම ෂූරාවේ උපදෙස් මත අමීර්වරයා පත්කරන තවත් ෂූරා සභිකයින් තුන්දෙනෙක්ද ඇතුලත් නවදෙනෙකුගෙන් යුක්තය.

73. ජමාඅතයේ ප්‍රත්පත්තිමය නොවන මූල්‍ය, පරිපාලන විනය හා සම්බන්ධීකරණ වැනි විෂයන්වලදී තීරණ ගන්නා සභාවක් වශයෙන් විධායක ෂූරාව කටයුතු කරයි. මෙය අවශ්‍යතා අනුව අමීර්ගේ උපදෙස් අනුව මහලේකම් විසින් රැස්කරනු ලැබේ.

## ලේකම් කාර්යාල ෂූරාව

74. මධ්‍යම මජ්ලිස් ෂූරාවේ වගකීම් හා මෙහෙවර ලිහිල් කිරීම වස් ජමාඅතයේ ලේකම් කාර්යාල ෂූරාවකින් සමන්විත වේ. එහි ස්වභාවය, සාමාජික සංඛ්‍යාව, ක්‍රියාවන් බලතල යනාදිය මජ්ලිස් ෂූරාව විසින් තීරණය කෙරේ. එහි සාමාජිකයින් නම් කරන්නේ මධ්‍යම මජ්ලිස් ෂූරාවයි. එහි මුලසුන දරන්නේ මහලේකම් වරයාය.

## අල් මජ්ලිස් (නියෝජිත සභාව)

75. ජමාඅතයේ ප්‍රතිපත්ති සම්පාදනය හා තීරණ ගැනීමේ කාර්යයේ මජ්ලිස් ෂූරාවට පමණක් දෙවෙනි සභාව අල් මජ්ලිස් වේ.

76. අල් මජ්ලිස් සභික සංඛ්‍යාව 197 කි. මෙයින් 150 දෙනෙකු ප්‍රාන්ත සාමාජික සභාවලින් එම සභිකයින් ලවා තෝරා පත්කෙරේ. මජ්ලිස් ෂූරාවේ උපදෙස් මත අල් මජ්ලිස් සභාවට සභිකයින් 26 දෙනෙක් අමීර් විසින් නම් කෙරේ. කාන්තා අංශයේ ජාතික කණ්ඩායම් සාමාජිකයින් 21 දෙනාම නිල වශයෙන් අජ් මජ්ලිස් සභාවේ සාමාජිකත්වය ලබති.

77. බලයේ සිටින මධ්‍යම ෂූරා සාමාජිකයින් හෝ ප්‍රාන්ත නාසිම්වරුන් අල් මජ්ලිසයට තෝරාපත්නොවූ විටක නිලවශයෙන් ඔවුහු අල් මජ්ලිස් සාමාජිකත්වය ලබති. මෙම

සාමාජිකත්වය 76 වගන්තියේ සඳහන් සාමාජික සජඛ්‍යාවට අමතරවයි.

78. 76 වගන්තියේ සඳහන් පරිදි ප්‍රාන්තවලින් තෝරාපත්වන 150 දෙනා තෝරාගැනීම මජ්ලිසුෂ් ෂූරා ඡන්ද විමසීම පවත්වන වර්ෂයේම ෂව්වාල් හා දුල් හජ් මාසය අතරතුර පැවැත්වෙන ප්‍රාන්ත සාමාජික සභා වාර්ෂික රැස්වීමේදී සිදු කෙරේ. මේසේ තෝරාපත්වන අල් මජ්ලිසය පදවිප්‍රාප්තිය ඊළඟ සෆර් මාසයේ සිදුවේ.

79. අල් මජ්ලිස් රැස්වීම් වලට මජ්ලිස් ෂූරාවෙන් නම්කරන නායිබ් අමීර්වරයෙකු මුලසන හොබවයි.

80. අල් මජ්ලිස් සභාවේ ප්‍රාන්තවලින් තෝරාපත්වන අයගෙන් පුරප්පාඩු ඇතිවූ විට එය වරණ ලැයිස්තුවේ ඊළඟ නම්වලින් සම්පූර්ණ කෙරේ. අමීර්වරයාගේ පත්වීම සම්බන්ධයෙන් ඇතිවෙන පුරප්පාඩු ෂූරාවේ උපදෙස් මත අමීර්වරයා විසින් සම්පූර්ණ කරනු ලැබේ.

81. අල් මජ්ලිස් අවම වශයෙන් වසරකට දෙවරක් රැස්විය යුතුය.

## අල් මජ්ලිසයේ බලතල හා වගකීම්

82. අල් මජ්ලිසයේ වගකීම් හා බලතල

අ. ජමාඅතයේ ප්‍රතිපත්ති සැකසීම, තීරණ ගැනීම යනාදියෙහි අමීර් සහ මජ්ලිස් ෂූරාව සමගින් ඒකාබද්ධව කටයුතු කිරීම.

ආ. අල් මජ්ලිසයේ සාකච්ඡාවෙන් පසුව පමණක් තීරණය ගත යුතුයැයි අමීර්වරයා හෝ මජ්ලිස් ෂූරා තීරණය කරන කාරණා සම්බන්ධයෙන් පරිශීලනය කර තීන්දු ගැනීම.

ඉ. මෙම ව්‍යස්ථාවේ වගන්ති සංශෝදනය කිරීම අළුත් වගන්ති ඇතුලත් කිරීම, අළුත් ව්‍යස්ථාවකින් මෙය අනුප්‍රාප්ත කිරීම.

ඊ. 52 වගන්තියට අනුව නායිබ් අමීර්වරුන් දෙදෙනෙකු තෝරාගැනීම.

උ. 62 වගන්තියට අනුව මධ්‍යම මජ්ලිස් ෂූරා සාමාජිකයින් තෝරාගැනීම.

එ. ප්‍රධාන තේරීම්භාර නිලධාරියා පත්කිරීම.

ඒ. වගන්ති 111,112 පරිදි ගණන් පරීක්ෂණ කණ්ඩායම හා ගණන් පරීක්ෂක නම් කිරීම.

## අල් මජ්ලිසුල් ආම් (සාමාජික සභාව)

83. ජමාඅතයේ සියළු මුන්තසිබ් සාමාජිකයින්, සහාය සාමාජිකයින් , කාන්ත අංශයේ අල් මජ්ලිස් සභිකයින්ගෙන් සහිත සභාව මජ්ලිසුල් ආම් වේ.

84. මජ්ලිසුල් ආම් රැස්වීම අමීර්වරයාගේ උපදෙසේ මත මහලේකම් විසින් රැස්කෙරේ.

85. අල් මජ්ලිසුල් ආම් සබාව වසර දෙකකට වරක් වත් රැස්කල යුතුය. අමීර්වරණය පැවැත්වෙන අල් මජ්ලිසුල් ආම් රැස්වීම මුහර්රම් මාසයේම පැවැත්වීමට කටයුතු කළ යුතුය. කිසියම් හේතුවක් නිසා මුහර්රම් මාසයේ පැවැත්වීමට අපොහොසත් බව මජ්ලිස් ෂූරාව තීරණය කරන විට එම වර්ෂයේම සෆර් මාසය ඇතුලත පැවැත්විය යුතුය.

86. අල් මජ්ලිසුල් ආම් රැස්වීම සඳහාවූ ආරාධනා රැස්වීම් දිනයට සති දෙකක්ට කලින් ලැබෙන සේ සාමාජිකයින්ට යැවිය යුතුය.

87. පොදුවේ අල් මජ්ලිසුල් ආම් රැස්වීම ජාතික වශයෙන් හෝ ප්‍රාන්තවල පොකුරු වශයෙන් පැවැත්වේ.

88. අමීර්වරණය පැවැත්වෙන මජ්ලිසුල් ආම් රැස්වීම ජාතික වශයෙන් පැවැත්වීමට නොහැති තත්වයක් තිබෙන බන මජ්ලිසු ෂූරාව තීරණය කරන විට ප්‍රාන්තවශයෙන් හෝ ප්‍රාන්තවල පොකුරු වශයෙන් හෝ පවත්වා අමීර්වරණය පැවැත්විය හැකිය.

## අල් මජ්ලිසුල් ආම්හි බලතල සහ වගකීම්

89. අල් මජ්ලිසුල් ආම්හි බලතල සහ වගකීම් පහත සඳහන්වේ ඃ

අ. අමීර්වරයා තේරීම.

ආ. ජමාඅතයේ අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා උපදෙස් ලබාදීම.

90. අල් මජ්ලිසුල් ආම් රැස්වීම්වල ජමාඅතයේ ක්‍රියාකාරකම් වාර්තා ඉදිරිපත් කළ යුතුය. ඒ පිළිබඳ අදහස් දැක්වීමට සාමාජිකයින්ට අවස්ථාව ලබාදිය යුතුය.

## මධ්‍යම පරිපාලන පදවි, කාරක සභා හා මණ්ඩල

91. ජමාඅතයේ අමීර්වරයා හා මධ්‍යම මජ්ලිසුෂ් ෂූරාව විසින් පත්කරනු ලබන සහකාර ලේකම්වරුන්, කණ්ඩායම් නායකයින්, අංශලේකම්වරුන්, අංශ ප්‍රධානීන් සහ විටින්විට පත්කරන කාරකසභා හා මණ්ඩල අමීර්වරයාට සහ මධයම මජ්ලිසුෂ් ෂූරාවට වගකිව යුතුය.

92. ඉහත සඳන් නිලධාරීන් කණ්ඩායම් හා මණ්ඩලවල වගකීම් හා බලතල මධ්‍යම මජ්ලිසුෂ් ෂූරාව මෙම ව්‍යස්ථාවේ විධි විධානවලට අනුකූලව විටින් වට තීරණය කරයි.

# පරිච්ඡේදය - 4
# ප්‍රාන්ත ව්‍යූහය

93. ජමාඅතයේ ප්‍රාන්ත ව්‍යූහය පහත ආකාරයට වේ ඃ

අ. ප්‍රාන්ත

ආ. උප ප්‍රාන්ත

ඉ. ශාඛා

94. මධ්‍යම මජ්ලිස් ෂූරාව, පරිපාලනය පහසු කිරීම සඳහා දිවයිනේ ප්‍රාන්ත එම ප්‍රාන්ත තුල උප ප්‍රාන්ත හා ශාඛා ස්ථාපිත කරයි. අවශ්‍ය වූ විටකදී ඒවා විසුරුවා හැරීමේ බලයද මජ්ලිස් ෂූරාව සතුය.

95. එක් එක් ප්‍රාන්තයකට නාසිම් වරයෙක් සිටී. ජමාඅතයේ ව්‍යස්ථාව හා රීතිවලට අනුකූලව මධ්‍යම නියාමනයට හා සැලසුම් කරනයට අනුව තම වගකීම යටතේ ඇති ප්‍රාන්ථ, උප ප්‍රාන්ථ හා ශාඛා මෙහෙයවීම නාසිම්ගේ වගකීමවේ.

96. ප්‍රාන්ත නාසිම්වරුන් අමීර්වරයා විසින් පත්කරනු ලැබේ.

97. ප්‍රාන්ත නාසිම්වරයෙකුට නොකඩවා එම පදවිය දැරිය හැක්කේ වාර තුනක්ය.

98. මධ්‍යම මජ්ලිස් ෂූරාවේ උපදෙස් මත නාසිම්වරුන් ඉවත් කිරීමේ බලය අමීර්වරයාට ඇත.

99. එක් එක් ප්‍රාන්ත සඳහා ප්‍රාන්ත සභාවක් ඇත. එම ප්‍රාන්ත

සභා ප්‍රදේශයේ ජීවත්වන මුන්තසිබ් සාමාජිකයින් එම සභාවේ සාමාජිකත්වය ලබති. ව්‍යවස්ථාවේ විධි විධාන අනුව ප්‍රාන්ත සාමාජික ලැයිස්තුව තීරණය කිරීමේදී අමීර්වරයාගේ නිගමනය අවසාන තීරණය වේ.

100. ප්‍රාන්ත නාසිම්වරයාට සහායවීමට ප්‍රාන්ත නාසිම් ඇතුලුව 9 සිට 13 දක්වාවූ සාමාජිකත්වයෙන් යුත් ප්‍රාන්ත ෂූරාවක් වේ. මෙහි දෙදෙනෙකු හැර අන් සාමාජිකයින් ප්‍රාන්ත සභාවේදී තෝරාග නු ලැබේ. දෙදෙනෙක් ප්‍රාන්ත ෂූරාවේ උපදෙස් ඇතිව ප්‍රාන්ත නාසිම් විසින් පත්කරනු ලැබේ.

101. ප්‍රාන්ත නාසිම් ප්‍රාන්ත ෂූරාවේ උපදෙස් ඇතිව හා මධ්‍යම ෂූරාවේ අනුමැතිය මත ප්‍රාන්ත ෂූරාවේ සාමාජිකයින්ගෙන් උපරිමය තිදෙනෙකු නියෝජ්‍ය නාසිම් වශයෙන් පත්කරනු ලැබේ.

102. ප්‍රාන්ත නියෝජ්‍ය නාසිම්වරුන්ගේ වගකීම විටින් විට ප්‍රාන්ත ෂූරාව විසින් තීරණය කෙරේ.

103. ජමාඅතයේ එක් එක් ශාඛාවට නාසිම්වරයෙකු සිටී. ප්‍රාන්ත නාසිම්ගේ හා ප්‍රාන්ත ෂූරාවේ මඟපෙන්වම යටතේ ජමාඅතයේ ව්‍යවස්ථාව රීති හා විටින් විට ගන්නා තීරණවලට අනුව ඔහු ශාඛා කටයුතු මෙහෙයවයි. ශාඛා නාසිම් සෘජුවම ශාඛා සභාවෙන් හෝ ශාඛා සභාවේ අනුමතිය ඇතුව ශාඛා ෂූරාව විසින් තෝරාගනු ලැබේ. ශාඛා නාසිම් දූරයට පවත්වන අයෙකු නොකඩවා වාර තුනක් පමණක් තනතුරු දැරිය හැකිය.

104. ශාඛා නාසිම්ට සහායවීමට 7-11 දක්වාවූ සාමාජිකයින්ගෙ න් සැදුම්ලත් ශාඛා ෂූරාවක් තිබේ. මෙයින් දෙදෙනෙකු හැර අන් සාමාජිකයින් ශාඛා සාමාජික සභාවෙන් තෝරාගැනේ. දෙදෙනෙකු ශාඛා ෂූරාවේ උපදෙස් සහිතව ශාඛා නාසිම් විසින් නම්කරනු ලැබේ.

## පරිච්ඡේදය - 5
## මුදල්

105. ජමාඅතයට අයත් මුදල් මධ්‍යම මජ්ලිස් ෂූරාවේ බාරයේ තිබේ. ජමාඅතයේ මුදල් ප්‍රතිපත්තිය මුදල් පාලනය, වාර්ෂික

අර්ධවාර්ෂික අයවැය මධ්‍යම මජ්ලිස් ෂූරාවේ අනුමැතිය සමඟ ක්‍රියාත්මකවේ.

106. ජමාඅතයේ මුදල් පහත දැවලින් සමන්විතවේ.

අ) සාමාජික මුදල්.

ආ) සාමාජිකයින් සහ සුභපතන්නන් ලබාදෙන පරිත්‍යාග

ඉ) ජමාතඅයට අයත් නිශ්චල හා චංඡල දේපළ හා ඉන් ලැබෙන ආදායම්.

උ) අමීර්වරයාගේ හෝ මධ්‍යම මජ්ලිස් ෂූරාවේ හෝ අනුමැතියෙන් ඉස්ලාමයට හා ශ්‍රීලංකාවේ නීතියට පටහැනි නොවන ආකාරයට උපයන හා රැස්කරන දේපළ.

107. ජමාඅතයේ මුදල් ලේකම්වරයාගේ වගකීම යටතේ පරිපාලනය වේ. ඔහු අමීර්ගේ සහ මජ්ලිසුෂ් ෂූරාවේ මගපෙන්වීම අනුව ක්‍රියා කරන්නෙකු හා ඔවුන්ට වගකියන්නෙකුද වේ.

108. ජමාඅතයේ වාර්ෂික හා අන්තර්කාලීන අයවැය මුදල් ලේකම් විසින් මධ්‍යම මජ්ලිස් ෂූරාවේ අනුමැකියට ඉදිරිපත් කෙරේ.

109. මෙම ව්‍යවස්ථවේ අරමුණ ඉලක්ක ඉටුකරගැනීම සඳහා නිශ්චල හා චංඡල දේපල තමන් සතුකරගැනීමේ, අයිතිකරගැනීමේ, හුවමාරුකිරීමේ, බැංකු ගිණුම් පවත්වාගෙන යාමේ හා ආයෝජන කිරීමේ බලය මජ්ලිස් ෂූරා සතුය.

110. වාර්ෂික මුදල් වාර්තාව මජ්ලිස් ෂූරා රැස්වීමකදී ඉදිරිපත්කර අනුමත කරගත යුතුය.

111. අල් මජ්ලිසනේ පත්කරන බලයලත් ගණන් පරීක්ශකයෙකු විසින් ජමාඅතයේ මුදල් වාර්තාව පරීක්ෂණයට ලක්වේ.

112. අල් මජ්ලිසය තම සාමාජිකයින්ගෙන් නවදෙනෙකුගෙන් යුත් ගණන් පරීක්ෂක කණ්ඩායමක් පත්කරයි. මෙම කණ්ඩායම ගණන් පරීක්ෂක විසින් සපයන මුදල් වාර්තාව පරීක්ෂා කර අල් මජ්ලිසයෙන් අනුමත කිරීමෙන් පසු විධිමත් මුදල් වාර්තාව වශයෙන් පිළිගැනේ. මෙම ගණන් පරීක්ෂණ කණ්ඩායමේ මජිලිස් ෂූරා සාමාජිකයින්ගේ සංඛ්‍යාව තුනට නොවැඩි විය යුතුය.

## පිරිච්ඡේදය - 6
## කාන්තා අංශය

113. ජමාඅතේ ඉස්ලාමය කාන්තා අංශයකින් සමන්විතය. එම අංශයේ පරිපාලනය විධිමත්ව කරගෙන යාම සඳහා 151 දෙනෙකුගෙන් යුත් කාන්තා අල් මජ්ලිසයකින් ද, 21 දෙනෙකුගෙන් යුත් ජාතික කණ්ඩායමකින්ද සමන්විතය. ජාතික කණ්ඩායම මෙහෙයවන ජාතික සංවිධායිකාවන්ද වේ.

## පරිච්ඡේදය - 7
## පොදු කරුණු

### වෘවස්ථා සංශෝදන හා වෙනස්කම්

114. අල් මජ්ලිසයට සහභාගිවූවන්ගේ 2/3 ක අනුමැතියෙන් මෙම වාවසථාවේ වගන්ති සංශෝදනය කිරීම හෝ අළුත් වගන්ති ඇතුලත් කිරීම හෝ අළුත් වාවස්ථාවක් ආදේශ කිරීමහෝ සිදුකළ හැකිය.

115. වාවස්ථා සංශෝදන යෝජනා අල් මජ්ලිස් සාමාජිකයින් විසින් ලිඛිතය මහලේකම්ට යැවිය යුතුය.

116. මජ්ලිස් ෂූරාව හදිසි යැයි තීරණය කරන වාවස්ථා සංශෝදන යෝජනා ඊළග මජ්ලිස් රැස්වීමේදී හෝ ඒ සඳහා රැස්කරන විශේෂ මජ්ලිස් රැස්වීමේදී හෝ ඉදිරිපත් කෙරේ.

117. අනෙකුත් යෝජනා මහලේකම්ට ලැබී වසරක් තුළ පැවැත්වෙන අල් මජ්ලිස් රැස්වමක හෝ ඒ සඳහා රැස්කරන විශේෂ අල් මජ්ලිස් රැස්වීමක හෝ මහලේකම් විසින් ඉදිරිපත් කෙරේ.

118. මෙවැනි සියළු යෝජනා ඒවා ඉදිරිපත්කිරීමට නියමිත රැස්වීම පැවැත්වීමට සතියකට පෙර ලැබෙන සේ අල් මජ්ලිස් සාමාජිකයින්ට යනවු ලැබේ

### ගණ පූරණය

119. ජමාඅතයේ සියළු රැස්වීම් සඳහා ගණපූරණය 51% කි.

120. ගණ පූරණය නොමැති විට රැස්වීම් කල් තබනු ලැබේ. එම කාරණය සඳහා රැස්කරන ඊළග රැස්වීමේදී ගණපූරණය සලකනු නොලැබේ

## තීරණ ගැනීම

121. ජමාඅතයේ තීරණ ගැනීම අල් කුර්ආන්, අස් සුන්නාහ් මඟපෙන්වීම අනුව කරනු ලැබේ. තීරණ හැකිතාක් එකඟතාවය මතම ගනු ලැබේ. එමෙන් එකඟතාවකට පැමිණීමට අපොහොසත් වූ විට ඡන්ද විමසීමක් පවත්වා ව්‍යවස්ථාවේ වෙනත් විධි විධාන නොමැති නම් සාමාන්‍ය බහුතරය මත තීරණය ගනු ලැබේ. මෙවැනි ඡන්ද විමසීමකදී සභාව සමාන ලෙස බෙදී ගියහොත් අමීර්ගේ ඡන්දය තීරණාත්මක වේ.

## රීති

122. මෙම ව්‍යවස්ථාවේ විධි විධාන නොමැති කරුණු හා ව්‍යවස්ථාවේ කරුණුවලට විග්‍රහයක් අවශ්‍ය විටකදී නියමයන් ඇතිකර ක්‍රියාත්මක කිරීමට හා ඒවා සංශෝදනය කිරීමට මජ්ලිස් ෂූරාවට බලය ඇත.

## පදවි ප්‍රාප්තිය

123. අමීර් හැර අන් සියළු පදවි කණ්ඩායම් සහා මණ්ඩල සඳහාවූ ආයුකාලය වසර දෙකක් වේ. කෙසේ වෙතත් අමීර් හා මජ්ලිස් ෂූරාව ලවා පත්කරන සියළු තනතුරු කණ්ඩායම් සහා අළුත් මජ්ලිස් ෂූරාවක් පත්වීම් සිදුවන තෙක් වලංගුවේ.

## පදවිලාභීන්ගේ බෛඅතය (දිවුරුම්දීම)

124. ජමාඅතයේ අමීර්වරයා හා මජ්ලිස් ෂූරා සාමාජිකයින් හැර අනෙකුත් පදවි වලට පත්කරනු ලබන්නන් ඇමුණුම 05 හි සඳහන් ආකාරයට අමීර්වරයා ඉදිරියේ දිවුරුම් දිය යුතුය.

125. ඕනෑම පදවියකට තෝරාපත්වන්නන් එය භාරගත් බව සහතික වන්නේ දිවුරුම් දීමෙන් පසුවයි.

## ඡන්ද විමසුම

126. ජමාඅතයේ ඡන්ද විමසීම් කටයුතු භාරව ඡන්ද ලේකම් කාර්යාලයක්වේ. එය ප්‍රධාන ඡන්දවිමසීම් නිලධාරිවරයෙකු කටයුතු කරන්නේ කෙරේ.

127 ජමාඅතයේ කිසිම ඡන්ද විමසීමක ජන්ද ප්‍රචාරය අනුමත නොකෙරේ.

128. මජ්ලිසුෂ් ෂූරාව මුන්තසිබ් සාමාජිකයින්ගේ සංඛ්‍යාව 200

ඉක්මවන ප්‍රාන්ත වල මජ්ලිස් ෂූරා හා අල් මජ්ලිස් ඡන්ද විමසුම් සඳහා 200 ට නොවැඩි සාමාජිකයින්ගෙන් යුත් කලාප වශයෙන් බෙදයි.

## සහාය සංවිධාන

129. මෙම ව්‍යවසථාවට පටැහිනි නොවන ආකාරයට ක්‍රියාකරන සංගම් සංවිධාන ආයතන ජමාඅතයේ සහය සංවිධාන වශයෙන් ක්‍රියාකිරීමට ඉල්ලීම් කළහොත් මධ්‍යම මජ්ලිස් ෂූරාව එම ඉල්ලීම පරීක්ෂා කර බලා සුදුසු යැයි තීරණය කළහෝ ජමාඅතය සහාය සංවිධාන වශයෙන් අනුමත කෙරේ.

130. එවැනි සංවිධානවල කටයුතුවලට ජමාඅතය වගකිවයුතු නොලබයි.

## ව්‍යස්ථා කටයුතු කමිටුව

131. ජමාඅතයේ ව්‍යවස්ථා කටයුතු කමිටුවක් ඇත. මෙම කමිටුව මජ්ලිස් ෂූරාව විසින් පත්කරනු ලැබේ. ව්‍යවස්ථාවේ වගන්තිවලට විග්‍රහ ලබාදීමේ බලය මෙම කමිටුව සතුවේ. එහි තීරණය අවසාන තීරණය වේ.

## විනිශ්චය කමිටුව

132. ජමාඅතයේ මජ්ලිස් ෂූරාවෙන් පත් කරන ලද විනිශ්චය කමිටුවක් තිබේ. එම කමිටුව ජමාඅතයේ පරිපානමය වශයෙන් පැනගින චෝදනා විභාග කර අමීර්වරයාට වාර්ථා කරයි.

## පරිපාලන වසර

133. ජමාඅතයේ පරිපාලන වසර යනු හිජ්රි වර්ෂයේ මුහර්රම් සිට දුල්හජ් දක්වාවූ මාස 12 වේ.

## විකල්ප විධි විධාන

134. මෙම ව්‍යස්ථාවේ විධි විධාන කෙසේවූවත් ව්‍යවස්ථාව වලංගු වන දිනට කලින් ක්‍රියාත්මකවූ තනතුරු කමිටු හා සබා එහි ආයුකාලය අවසානය තෙක් අහෝසි නොවේ.

## කාර්යයන් විමධ්‍යගත කිරීම

134. ව්‍යවස්ථාවේ විධි විධානවලට අනුව පත් කරන ලද තනතුරුලාභීන් ස්ථාපිතකරන ලද සභාවන්, ආයතන කමිටු සහ ඒකක ආදිය ජමාඅතයේ ප්‍රතිපත්තිය, ඉලක්ක සහ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය බලතල ජමාඅතය විසින් විමධ්‍ය ගතකල හැකිය. එසේ විමධ්‍ය ගත කිරීමෙන් යම් පුද්ගලයෙකු හෝ සභාවකින් ඉටුකරන කාර්යයන් ජමාඅත් කළ බව පිළිගැනේ.

## ව්‍යවස්ථාවේ භාෂා අතර පරස්පරතා

136. මෙම ව්‍යවස්ථාවේ එක් එක් භාෂා වලින් යුත් වාක්‍යයන් අතර පරස්පරතාවයන් වුවහොත් දෙමළ භාෂාවෙන් යුත් පද ප්‍රධාන වේ.

## බල පැවැත්නෙ දිනය

137. මෙම ව්‍යස්ථාව 2016 වර්ෂයේ සැප්තැම්බර් මස 17 වෙනි දින සිට බලපැවැත්වේ.

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි
ව්‍යවස්ථාව
ඇමුණුම - 05

**තනතුරුලාභීන් බෛඅත්**

بِسْمِ اللهِ الرَّحْمَنِ الرَّحِيم

أشهد أن لا إله إلا الله وحده لا شريك له وأشهد أن محمداً عبده ورسوله

නැමදුම් කිරීමට සුදුස්සෙකු නොමැත අල්ලාහ් හැර, මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ්ගේ ගැත්තා සහ වක්තෘවරයා බව සාක්ෂි දරමි.

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමයේ ........................................ තනතුර බාරගන්නා .......................................... වන මම ජමාඅතයේ ව්‍යවස්ථාව අනුව මා හට පවරන වගකීම් වලට මගේ හිමිකරු අල්ලාහ්ට උත්තර බැදිය යුතුයි යන හැඟීමෙන් හා අල්ලාහ්ගේ තෘප්තිය ලැබීමේ අරමුණින් ඉටුකිරීමට උත්සාහ දරණ බවත් හෘදයාංගව හා වගකීමෙන් යුතුව පොරොන්දු වෙමි. (ඉන්ෂා අල්ලාහ්) මෙහිදී වැරදි කළේනම් හෝ නොසැලකිලිමත්ව ක්‍රියාකලහොත් මා පිළිබඳව ජමාඅතය ගන්නා තීරණ පිළිගන්නා බවත් පිළිගෙන මෙහි පහත අත්සන තබමි.

අත්සන ........................... දිනය .......................

ලිපිනය ...........................................

...........................................................

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි
ව්‍යවස්ථාව
ඇමුණුම - 04

## මධ්‍යම මජ්ලිස් ෂූරා සාමාජික බෛඅත්

بِسْمِ اللَّهِ الرَّحْمَنِ الرَّحِيم

أشهد أن لا إله إلا الله وحده لا شريك له وأشهد أن محمداً عبده ورسوله

නැමදුම් කිරීමට සුදුස්සෙකු නොමැත අල්ලාහ් හැර, මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ්ගේ ගැත්තා සහ වක්තෘවරයා බව සාක්ෂි දරමි.

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමයෙන් මධ්‍යම ෂූරා සාමාජික තනතුරක් බාරගන්නා ................................ වන මම අල්ලාහ්ගේ ආදරය දිනාගත යුතුය යන උනන්දුවෙන් හා ඔහුගේ කෝපයෙන් මිදීමේ අධිෂ්ඨානයෙන් මාගේ අදහස් ප්‍රකාශකරන බවත් වගකීම් ඉටුකරන බවත්, ආදර්ශවත් ඉස්ලාමීය ජීවිතයක් ගත කිරීමට උත්සාහ දරන බවත් පොරොන්දුවෙමි. ඉන්ෂා අල්ලාහ්.

දිනය ..........................

අත්සන ......................

ලිපිනය ..........................................

.........................................................

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාම්
ව්‍යවස්ථාව
ඇමුණුම - 03

## ‘අමීර්’ ට සාමාජිකයින් කරන බෛඅත්

بِسْمِ اللَّهِ الرَّحْمَنِ الرَّحِيم

**أشهد أن لا إله إلا الله وحده لا شريك له وأشهد أن محمداً عبده ورسوله**

නැමදුම් කිරීමට සුදුස්සෙකු නොමැත අල්ලාහ් හැර, මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ්ගේ ගැත්තා සහ වක්තෘවරයා බව සාක්ෂි දරමි.

................................ වන මම ඔබතුමාව/එතුමාව ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමයේ අමීර් වශයෙන් හිතට එකඟව පිළිගන්නා මම ඉස්ලාමීය අණවලට පටහැනි නොවන ආකාරයේ ඔබගේ /ඔහුගේ සියළු අණවලට කීකරුව කටයුතු කරන බවත් මෙයින් පොරොන්දු වෙමි.

| අනු අංකය | නම | ප්‍රාන්තය | අත්සන | දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමී
ව්‍යවස්ථාව
ඇමුණුම - 02

## අමීර්වරයාගේ බෙඅත්

**أشهد أن لا إله إلا الله وأشهد أن محمداً عبده ورسوله**

නැමදුම් කිරීමට සුදුස්සෙකු නොමැත අල්ලාහ් හැර, මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ්ගේ ගැත්තා සහ වක්තෘවරයා බව සාක්ෂි දරමි.

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමියේ 'අමීර්' පදවිය බාරගන්නා ............................ වන මම මාගේ එක් එක් ක්‍රියාවන්ට හිමිකරුවන අල්ලාහ් වෙත උ්තර බැදිය යුතුයි යන හැඟීමෙන් හා අල්ලාහ්ගේ තෘප්තිය ලබාගැනීමේ එකම අරමුණින් අල් කුර්ආනයේ හා සුන්නාවේ මඟපෙන්වීම් අනුව සියළු කාර්යයන් කිරීමට උත්සාහය දරන බවත් ජමාඅතයේ ව්‍යවස්ථාව හා තීරණ වලට ගරුකරමින් මෙම සංවිධානය මෙහෙයවන බවත් හෘදයාංග වම හා වගකීමෙන් යුතුව පොරොන්දුවෙමි. ඉන්ෂා අල්ලාහ්

නම ................................

ලිපිනය ................................................................................

......................................................................................................

දිනය ..............................

අත්සන .........................

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි
ව්‍යවස්ථාව
ඇමුණුම - 01

## සාමාජික බෙඅත්

**أشهد أن لا إله إلا الله وأشهد أن محمداً عبده ورسوله**

නැමදුම් කිරීමට සුදුස්සෙකු නොමැත අල්ලාහ් හැර, මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ්ගේ ගැත්තා සහ වක්තෘවරයා බව සාක්ෂි දරමි.

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමීය මුන්තසිබ් සාමාජිකත්වය ලබන ............................... (නම) නැමැති මම

අ) මාගේ සාමාජිකත්වය නිසා මා හට පවරනු ලබන වගකීම් අල්ලාහ් වෙනුවෙන් සම්පූර්ණයෙන් ඉටුකිරීමට උත්සාහ දරන බවත්

ආ) මාගේ සාමාජිකත්ව සුදුසුකම්වල අඩුපාඩු වුවහොත් හෝ මාගේ වගකීම් මා පැහැර හැරියහොත් ඒ වෙනුවන් ජමාඅතය මා සම්බන්ධයෙන් ගනු ලබන තීරණ හිතට එකඟව පිළිගන්නා බවත්

ඉ) මාව පවිත්‍රකරගැනීමටත් "ඉකාමතුද්දීන්" කර්තව්‍යයේ අල්ලාහ් වෙනුවෙන් පිරිසිදු චේතනාවෙන් මා ක්‍රියාකිරීමටත් මා හට දයාළුවන ලෙස සර්වබලධාරී අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කර ඔහු වෙත තවක්කුල් තබා මෙහි අත්සන් තබමි.

දිනය ..........................

අත්සන ..........................

ලිපිනය ..................................................................................
..................................................................................

77, ශ්‍රී වජිරඥාණ මාවත, කොළඹ 00900
Tel: +94 112 68 7091 | Fax: +94 112 68 6030